# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/42 - 2018 ජූලි මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81 (II)

**1980 අංක 47 ජාතික පාරිසරික පනත**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ඒ සහ 23ඔ යන වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු එකී පනතේ 32 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2018 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

කලින් කල සංශෝධිත 2003 ජුනි මස 30 වන දින අංක 1295/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2003 අංක 1 දරන ජාතික පාරිසරික (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ඃ

(1) එහි III වන කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඃ-

" III වන කොටස

**වාහන ආනයනය, නිෂ්පාදනය හෝ එකලස් කිරීම සඳහා වන වාහන විමෝචන ප්‍රමිති**

(6) (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් එකලස් කරනු ලබන හෝ නිෂ්පාදය කරනු ලබන සෑම මෝටර් වාහනයක් සඳහාම වන අවසර ඇති වාහන වායු විමෝචන සීමාවන් මෙහි තුන්වන උපලේඛනයේ දැක්වෙන පරිදි විය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) ශ්‍රී ලංකාව තුළ දී මෝටර් වාහනයක් හෝ එන්ජිමක් නිෂ්පාදය කරන හෝ එකලස් කරන සෑම තැනැත්තකු විසින් ම, වර්ග අනුමැතිය සඳහා අනුකූලතා සහතිකයක් සැපයිය යුතු අතර, අනුකූලතා සහතිකය සැපයීම සඳහා පිරික්සා බැලිය යුතු අවම සාම්පල් සංඛ්‍යාව මෙහි හතරවන උපලේඛනයේ දැක්වෙන පරිදි විය යුතු ය.

(3) මෝටර් වාහනයක් ආනයනය කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම, වාහන නිෂ්පාදකයා විසින් හෝ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් පිළිගනු ලබන ප්‍රතීත වාහන වායු විමෝචන පරීක්ෂන මධ්‍යස්ථානයක් විසින් නිකුත් කරන ලද වාහන වායු විමෝචන ප්‍රමිති පිළිබඳ අනුකූලතා සහතිකයක් ශ්‍රී ලංකා රේගුවට සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මෝටර් වාහනයක් එකලස් කරන හෝ නිෂ්පාදනය කරන සෑම තැනැත්තකු විසින් ම එසේ නිෂ්පාදනය කරන ලබන හෝ එකලස් කරනු ලබන සෑම වාහන වර්ගයක් සඳහාම මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාව ඇතිව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පිළිගත් යම් ප්‍රතීත වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් විසින් නිකුත් කරන ලද වාහන වායු විමෝචන ප්‍රමිති පිළිබඳ වර්ග අනුමත කිරීමේ සහතිකයක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) මෝටර් වාහනයක් ලියාපදිංචි කරන සෑම තැනැත්තකු විසින් ම වාහන නිෂ්පාදකයා විසින් හෝ යම් ප්‍රතීත වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් විසින් නිකුත් කරන ලද වාහන වායු විමෝචන ප්‍රමිති පිළිබඳ වර්ග අනුමත කිරීමේ සහතිකයේ සහතික කල පිටපතක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) කාබන් මොනොක්සයිඩ් (CO), හයිඩ්‍රෝකාබන් (HC), නයිට්‍රජන් ඔක්සයිඩ් (NOx), අංශුමය ද්‍රව්‍ය (PM) සහ හයිඩ්‍රෝකාබන් හා නයිට්‍රජන් ඔක්සයිඩ් (HC + NO x) සඳහා වාහන වායු විමෝචන ප්‍රමිති අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කර සහතික කිරීමට භාවිත කරනු ලබන මැනීමේ උපකරණ මෙහි තුන්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ක්‍රමයට අනුකූල වන්නේ නම් මිස, කාබන් මොනොක්සයිඩ් (CO), හයිඩ්‍රෝකාබන් (HC), නයිට්‍රජන් ඔක්සයිඩ් (NOx), අංශුමය ද්‍රව්‍ය (PM) සහ හයිඩ්‍රෝකාබන් හා නයිට්‍රජන් ඔක්සයිඩ් (HC + NO x) සඳහා වාහන වායු විමෝචන මට්ටම් සම්බන්ධයෙන් ප්‍රතීත වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් විසින් මේ නියෝග යටතේ නිකුත් කරනු ලබන කිසිම සහතිකයක් වලංගු ලෙස නොසැලකිය යුතු ය.

(7) වාහන වායු විමෝචන මට්ටම්හි ධූම පාරාන්ධතාව සඳහා ප්‍රතීත වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් විසින් මේ නියෝග යටතේ නිකුත් කරන ලද කිසිම සහතිකයක්, එම ධූම පාරාන්ධතාව පිළිබඳ වූ වාහන වායු විමෝචන ප්‍රමිතිවලට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කර සහතික කිරීම සඳහා භාවිත කරන මැනීමේ උපකරණ මෙහි තුන්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ක්‍රමයට අනුකූල වන්නේ නම් මිස, වලංගු සහතිකයක් ලෙස නොසැලකිය යුතු ය.

(2) එහි තුන්වන උපලේඛනය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :

"තුන්වන උපලේඛනය

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන වාහන හා එන්ජින් සඳහා සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හෝ එකලස් කරනු ලබන වාහන සහ එන්ජින් සඳහා අදළ වන විමෝචන ප්‍රමිති.**

**1 වන වගුව : වාහනයේ දළ බර කිලෝ ග්‍රෑම් 3500ට වඩා අඩු (GVW < 3500kg) පෙට්‍රල් වාහන සඳහා වන විමෝචන ප්‍රමිති**

| වාහන වර්ගය | වාහන වර්ගය සහ වාහනයේ RM | කාබන් මොනොක්සයිඩ් CO g/km | හයිඩ්‍රෝ කාබන් HC g/km | නයිට්‍රජන් ඔක්සයිඩ් NOx g/km | පරීක්ෂණ ක්‍රමය |
|---|---|---|---|---|---|
| වාහනයේ දළ බර කි.ග්‍රෑ 2500 ට අඩු හෝ ඊට සමාන (GVW < 2500 kg) වාහන හෝ ආසන හයක් දක්වා වූ වාහන | සියලු | 1.00 | 0.1 | 0.08 | NEDC, MIDC හෝ ඒ හා සමාන |
| වාහනයේ දළ බර කි.ග්‍රෑම් 2500ට වැඩි හෝ ඊට සමාන හෝ කි.ග්‍රෑ. 3500ට අඩු හෝ ඒ හා සමාන (2500 kg < GVW < 3500 kg) වාහන හෝ ආසන හයක් දක්වා වූ වාහන | 1 වන පන්තිය < 1305 kg | 1.00 | 0.1 | 0.08 | NEDC, MIDC හෝ ඒ හා සමාන |
| | 2 වන පන්තිය 1306 kg-1760 kg 1760kg | 1.81 | 0.13 | 0.10 | NEDC, MIDC හෝ ඒ හා සමාන |
| | 3 වන පන්තිය > 1761 kg | 2.27 | 0.16 | 0.11 | NEDC, MIDC හෝ ඒ හෝ ඒ හා සමාන |

(අ) GVW යන්නෙන් වාහනයේ දළ බර අදහස් වේ.
(ආ) RM යන්නෙන් වාහනයක සැදහුම් ස්කන්ධය (reference mass) අදහස් වේ.
(ඇ) NEDC යන්නෙන් නව යුරෝපීය රිය ධාවන චක්‍රය අදහස් වේ.
(ඈ) MIDC යන්නෙන් වැඩි දියුණු කරන ලද ඉන්දියානු රිය ධාවන චක්‍රය අදහස් වේ.

**2 වන වගුව : වාහනයේ දළ බර කිලෝ ග්‍රෑම් 3500ට වඩා අඩු (GVW < 3500kg) ඩීසල් වාහන සඳහා වූ විමෝචන ප්‍රමිති**

| *වාහන වර්ගය* | *වාහන වර්ගය සහ වාහනයේ RM* | *කාබන් මොනොක් සයිඩ් g/km* | *හයිඩ්‍රෝකාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ් HC + NOx g/km* | *නයිට්‍රජන් ඔක්සයිඩ් NOx g/km* | *PM g/km* | *පරීක්ෂණ ක්‍රමය* |
|---|---|---|---|---|---|---|
| GVW < 2500 kg සහිත හෝ ආසන හයක් සහිත වාහන | සියලු | 0.50 | 0.30 | 0.25 | 0.025 | NEDC/MIDC හෝ ඒ හා සමාන |
| 2500 kg < GVW < 3500 kg සහිත හෝ ආසන හයට වැඩි වාහන | 1 වන පන්තිය < 1305 kg (කි.ග්‍රෑ.) | 0.50 | 0.30 | 0.25 | 0.025 | NEDC/MIDC හෝ ඒ හා සමාන |
| | II වන පන්තිය 1306 kg-1760 kg 1760kg (කි.ග්‍රෑ.) | 0.63 | 0.39 | 0.33 | 0.040 | NEDC /MIDC හෝ ඒ හා සමාන |
| | III වන පන්තිය > 1761 kg (කි.ග්‍රෑ.) | 0.74 | 0.46 | 0.39 | 0.060 | NEDC/MIDC හෝ ඒ හෝ ඒ හා සමාන |

(අ) GVW යන්නෙන් වාහනයේ දළ බර අදහස් වේ.
(ආ) RM යන්නෙන් වාහනයක සැදහුම් ස්කන්ධය (reference mass) අදහස් වේ.
(ඇ) NEDC යන්නෙන් නව යුරෝපීය රිය ධාවන චක්‍රය අදහස් වේ.
(ඈ) MIDC යන්නෙන් වැඩි දියුණු කරන ලද ඉන්දියානු රිය ධාවන චක්‍රය අදහස් වේ.

**3 වන වගුව : රෝද දෙකේ පෙට්‍රල් වාහන සඳහා වූ භාරමිතික විමෝචන ප්‍රමිති**

**I වන කොටස** : වාහනවල වර්ගය හා වර්ගීකරණය

| *වාහන වර්ගය* | *වර්ගයේ වර්ගීකරණය* |
|---|---|
| 1 වර්ගය | 50cc < එන්ජින් ධාරිතව < 150cc සහ V max (උපරිම වේගය) < 50km/h හෝ එන්ජින් ධාරිතාව < 150 cc සහ 50km/h<V max <100km/h |
| 2 වර්ගය | එන්ජින් ධාරිතාව < 150 cc සහ 100km/h < V max (උපරිම වේගය) < 115 km/h හෝ එන්ජින් ධාරිතාව 150 cc සහ V max (උපරිම වේගය) < 115 km/h |
| 3 වර්ගය | 115 km/h < V max (උපරිම වේගය) < 130 km/h වූ රෝද දෙකේ වාහන |
| 4 වර්ගය | 130 km/h < V max (උපරිම වේගය) < 140 km/h වූ රෝද දෙකේ වාහන |
| 5 වර්ගය | V max (උපරිම වේගය) > 140 km/h වූ රෝද දෙකේ වාහන |

(අ) උපරිම වේගය V max යන්නෙන් රෝද දෙකේ වාහනයක උපරිම වේගය අදහස් වේ.
(ආ) ඩීසල් එන්ජිමක් සවිකර ඇති රෝද දෙකේ වාහනයක් සම්බන්ධයෙන් මේ උපලේඛනයේ 4 වන වගුවේ II වන කොටසේ ඩීසල් ත්‍රීවිලර් සඳහා නියම කර ඇති වායු විමෝචන ප්‍රමිති අදළ විය යුතු බවට මේ නියෝගයේ විධිවිධාන සලස්වා ඇත.

II වන කොටස : භාරමිතික විමෝචන ප්‍රමිති

| වාහන වර්ගය | කාබන් මොනොක්සයිඩ් CO (g/km) | නයිට්‍රජන් ඔක්සයිඩ් NOx (g/km) | හයිඩ්‍රොකාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ් (HC + NOx) (g/km) | |
|---|---|---|---|---|
| | | | 2g/පරීක්ෂණයට අනුකුල වාෂ්පීකරණ විමෝචන | 6g/පරීක්ෂණයට අනුකුල වාෂ්පීකරණ විමෝචන |
| 1 සහ 2 වර්ගය | 1.403 | 0.39 | 0.79 | 0.59 |
| 3 වර්ගය | 1.970 | 0.34 | 0.67 | 0.47 |
| 4 සහ 5 වර්ගය | 1.970 | 0.20 | 0.40 | 0.20 |

භාරමිතික විමෝචනය තීරණය කිරීම සඳහා අදළ වන පරීක්ෂණය වනුයේ ලෝක ගැලපුම් යතුරු පැදි පරීක්ෂණ චක්‍රය (World Harmonized Motorcycle Test Cycle - WMTC) වේ.

III වන කොටස : එන්ජින් ධාරිතාව 50 cc ට සමාන හෝ ඊට අඩු සහ උපරිම වේගය පැයට කිලෝමීටර් 50 (V max 50 km/h) සමාන හෝ ඊටඅඩු රෝද දෙකේ වාහන සඳහා භාරමිතික විමෝචන ප්‍රමිතිය.

| විස්තරය | කාබන් මොනොක්සයිඩ් CO | හයිඩ්‍රොකාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ් HC+NOx |
|---|---|---|
| මිතිය (g/km) | 0.75 | 0.75 |
| වියකීමේ සාධකය (DF) | 1.2 | 1.2 |

භාරමිතික විමෝචනය තීරණය කිරීම සඳහා අදළ වන පරීක්ෂණය වනුයේ ලෝක ගැලපුම් යතුරු පැදි පරීක්ෂණ චක්‍රය (World Harmonized Motorcycle Test Cycle - WMTC) වේ.

**4 වන වගුව : ත්‍රීවිලර් සඳහා වූ භාරමිතික විමෝචන ප්‍රමිති**

**I වන කොටස : පෙට්‍රල් එන්ජින් සවිකර ඇති ත්‍රීවිලර් සඳහා භාරමිතික විමෝචන ප්‍රමිති**

| විස්තරය | CO කාබන් මොනොක්සයිඩ් | හයිඩ්‍රොක්කාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ් (HC + NOx) | |
|---|---|---|---|
| | | 2g/පරීක්ෂණයට අනුකුල වාෂ්පීකරණ විමෝචන | 6g/පරීක්ෂණයට අනුකුළ වාෂ්පීකරණ විමෝචන |
| ප්‍රමිතිය (g/km) | 0.94 | 0.94 | 0.74 |
| වියකීමෙ සාධකය (DF) | 1.2 | 1.2 | 1.2 |

(අ) GVW භාරමිතික මෝචනය තීරණය කිරීම සඳහා අදළ වන පරීක්ෂණ වනුයේ WMTC හෝ ඉන්දියානු රිය ධාවන චක්‍රය (Indian Drive Cycle - IDC) වේ.

(ආ) වාෂ්ප වන වායු විමෝචන තීරණය කිරීම - hot sock lost test : one hour and Diurnal lot test : one hour (පැය එකක්)

II කොටස : ඩීසල් (සම්පීඩන ජ්වලන) එන්ජිමක් සවිකර ඇති ත්‍රීවිලර් සඳහා හාරමිතික විමෝචන ප්‍රමිති :

| *විස්තරය* | *කාබන් මොනොක්සයිඩ් CO* | *හයිඩ්‍රොක්කාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ් ( HC + NOx)* | *PM* |
|---|---|---|---|
| ප්‍රමිතිය (g/km) | 0.38 | 0.38 | 0.0425 |
| වියකීමෙ සාධකය (DF) | 1.1 | 1.0 | 1.2 |

(අ) හාරමිතික මෝචනය තීරණය කිරීම සඳහා අදළ වන පරීක්ෂණ වනුයේ WMTC හෝ ඉන්දියානු රිය ධාවන චක්‍රය (Indian Drive Cycle - IDC) වේ.

III කොටස : සම්පීඩිත ස්වභාවික වායු (CNG) හෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LPG) එන්ජින් සවිකර ඇති ත්‍රීවිලර් සඳහා වූ හාරමිතික විමෝචන ප්‍රමිති :

| *විස්තරය* | *කාබන් මොනොක්සයිඩ් CO* | *හයිඩ්‍රොක්කාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ HC + NOx* |
|---|---|---|
| ප්‍රමිතිය (g/km) | 0.94 | 0.94 |
| වියකීමේ සාධකය (DF) | 1.2 | 1.2 |

හාරමිතික මෝචනය තීරණය කිරීම සඳහා අදළ වන පරීක්ෂණ වනුයේ WMTC හෝ ඉන්දියානු රිය ධාවන චක්‍රය (Indian Drive Cycle - IDC) වේ.

5 වන වගුව : බර වාහන සහ බර වාහන එන්ජින් සඳහා වූ විමෝචන ප්‍රමිති

| *වාහන වර්ගය* | *කාබන් මොනොක්සයිඩ් CO g/kWh* | *THC g/kWh* | *$CH_4$ g/kWh* | *නයිට්‍රජන් ඔක්සයිඩ NOx g/kWh* | *PM g/kWh* | *දුම $m^{-1}$* | *පරීක්ෂණ ක්‍රමය* |
|---|---|---|---|---|---|---|---|
| ඩීසල් වාහන GVW>3500kg | 1.5 | 0.46 | N/A | 3.5 | 0.02 | 0.5 | ESC |
| CNG හෝ LPG හෝ වෙනත් GVW>3500kg | 4.0 | N/A | 1.1 | 3.5 | 0.03 | N/A | ETC |

(අ) දුම යන්නෙන් මීටර් එකකට ($m^{-1}$) නිදහස් ත්වරණ ධූම පාරාන්ධතාව (free acceleration smoke opacity) අදහස් වේ.
(ආ) ESC යන්නෙන් ස්ථාවර තත්ත්වයේ එන්ජින් ධාවන චක්‍රය (engine steady-state cycle) අදහස් වේ.
(ඇ) ETC යන්නෙන් විචලන තත්ත්වයේ එන්ජින් ධාවන චක්‍රය (engine steady-state cycle) අදහස් වේ.
(ඈ) THC යන්නෙන් සම්පූර්ණ හයිඩ්‍රෝ කාබන් (total hydrocarbon) අදහස් වේ.

6 වන වගුව : ඉදිකිරීම් උපකරණ වාහන සඳහා වූ විමෝචන ප්‍රමිති

| උපකරණියේ බලය අනුව වර්ගය | කාබන් මොනොක්සයිඩ් *CO* g/kWh | හයිඩ්‍රොකාබන් + නයිට්‍රජන් ඔක්සයිඩ HC+NOx g/kWh | PM g/kWh | දුම $m^{-1}$ | පරීක්ෂණ ක්‍රමය |
|---|---|---|---|---|---|
| kW < 8 | 8.0 | 7.5 | 0.8 | 3.25 | වෙනස් කළ හැකි වේගය සහිත එන්ජින් සඳහා වූ ISO 8178-4 "CI" 8 දරන පරීක්ෂණ ක්‍රමය හෝ වේගය වෙනස් නොවන එන්ජින් සඳහා වූ ISO 8178-4 "D 2" 5 දරන පරීක්ෂණ ක්‍රමය |
| 8 < kW < 19 | 6.6 | 7.5 | 0.8 | 3.25 | |
| 19 < kW < 37 | 5.5 | 7.5 | 0.6 | 3.25 | |
| 37 < kW < 75 | 5.0 | 4.7 | 0.4 | 3.25 | |
| 75 < kW < 130 | 5.0 | 4.0 | 0.3 | 3.25 | |
| 130<kW | 3.5 | 4.0 | 0.2 | 3.25 | |

ධූමය යන්නෙන් එක මීටරයක් ($m^{-1}$) සඳහා සම්පූර්ණ බරෙන් 80%ක් වූ ධූම පාරාන්ධතාව අදහස් වේ.

(3) තුන්වන උපලේඛනයට ඉක්බිතිව පහයත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීමෙන් :

''හතරවන උපලේඛනය

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන හෝ එකලස් කරන වාහන, එන්ජින් සහ/හෝ උපකරණ සඳහා වූ අනුකූලතා අවශ්‍යතාවය

| වාහනය/එන්ජිම | වාර්ෂික නිෂ්පාදනය කිරීමේ /එකලස් කිරීමේ ධාරිතාව | | නිෂ්පාදන (COP *) සංඛ්‍යාතය | අවම නිෂ්පාදන අනුකූලතා (COP) සාම්පලය |
|---|---|---|---|---|
| | දක්වා | ඊට වැඩි | | |
| රෝද දෙකේ වාහන/ත්‍රීවිලර් | 500 | - | සෑම වසරකටම එක් වරක් | 1 |
| රෝද දෙකේ වාහන/ත්‍රීවිලර් ** | - | 501 | සෑම වසරකටම එක් වරක් | 3 |
| සැහැල්ලු මඟී වාහන | - | - | මාස හයකට එක් වරක් | 3 |
| සැහැල්ලු වෙළෙඳ වාහන ** | - | - | මාස හයකට එක් වරක් | 3 |
| සියලු බර වාහන ** | - | - | සෑම වසරකටම එක් වරක් | 3 |
| එන්ජින්/උපකරණ | - | - | සෑම වසරකටම එක් වරක් | 3 |

COP (*) : නිෂ්පාදන අනුකූලතාවය අදහස් වේ.
** - මෝටර් වාහයන පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය.''

07 - 894

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.